# වික්ෂෝප දේව මාතාවන්ගේ
## මංගල්‍යය

## පළමුවන දේව ප්‍රකාශනය හෙබ්‍රෙව් 5: 7–9

*හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"ජේසුස් වහන්සේ සදාතන විමුක්තිදායකයාණෝ වූ සේක."

ක්‍රිස්තුන් වහන්සේ මිනිසත්බව ගෙන සිටිය දී තමන් මරණයෙන් ගළවන්නට පිළිවන් වූ තැනැන් වහන්සේට බලවත් හැඬීමෙනුත් කඳුළු සැලීමෙනුත්, යාච්ඤා ද, කන්නලව් ද ඔප්පු කළ සේක. උන් වහන්සේගේ දේව ගරුබිය නිසා, දෙවියන් වහන්සේ එයට සවන් දුන් සේක. උන් වහන්සේ පුත්‍රයාණන් වූ නමුත්, තමන්ගේ දුක් විඳීමෙන් කීකරුකම ඉගෙනගත් සේක. මෙසේ උන් වහන්සේ සම්පූර්ණත්වය ලැබ, තමන් වහන්සේට කීකරුවන සියල්ලන්ගේ සදාතන විමුක්තිදායකයාණෝ වූ සේක. තවද මෙල්කිසදෙක් පූජක පරපුර අනුව, උත්තම පූජක නාමය ද දෙවියන් වහන්සේගෙන් ලත් සේක.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 31: 1–5, 14–15, 19

පිළිතුර : සමිඳුනි, ඔබේ තිර පෙම නිසා අප ගැළෙව්ව මැනව.

ගීය : සමිඳුනි, ඔබෙ රැකවරණය සොයා එමි.
කිසිදාක මම නින්දාවට පත් නොවෙම්වා.
ඔබේ දැහැමිකමින් මා මුදාලුව මැනව.
මා දෙස ඔබේ දෙසවන යොමා, නොපමා ව මා මිදුව මැනව,
මට බලගතු විමුක්ති පර්වතයක් ද
ආරක්ෂක බලකොටුවක් ද වුව මැනව.

ඔබ මාගේ පර්වතය හා බලකොටුව ය.
එබැවින් ඔබේ නාමයේ අනුහසින් මට මඟ පෙන්වා
මා ගෙන ගිය මැනව.
මා ඇල්ලීමට ඔවුන් සඟවා ඇති දැලෙන් මා බේරාගත මැනව.
ඔබ මාගේ රක්ෂස්ථානය ය.

ඔබ අතට මාගේ ජීවිතය භාර කරමි.
සත්‍යවාදී දෙවි සමිඳුනි, ඔබ මා මිදූ සේක.
එහෙත් සමිඳුනි, මා විශ්වාසය තැබුවේ ඔබ කෙරෙහි ම ය.
"මාගේ දෙවියෝ ඔබ ය" යි කියමි.

මාගේ ජීවිත ගමන ඔබ අතෙහිය,
මාගේ සතුරන් හා මට පීඩා කරන්නවුන්
අතින් මා මුදා හැරිය මැනව.
දේව ගරුබිය ඇත්තන් උදෙසා තබා ඇති
ඔබේ ගුණවත්කම කොතරම් ද?
ඔබ කෙරේ විශ්වාසය තැබූ අය වෙත
එය කොතරම් මහත් ලෙස පෙනේ ද?

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
කන්‍යා මරියාවෙනි, ඔබ ආසිරි ලද්දී ය.
සමිඳාණන්ගේ කුරුසිය ළඟ සිටින්නී නොනැසී දිවි පුදා
ප්‍රාණපරිත්‍යාගි කිරීටය අත්කර ගත්තෙහි ය.
ආලේලූයා!

## සුවිශේෂය ජොහන් 19: 25–27

*සුවිශේෂක ජොහන් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"ජේසුස් වහන්සේගේ මෑණියෝ ද උන් වහන්සේගේ
කුරුසිය ළඟ සිටියා හ."

ජේසුස් වහන්සේගේ මෑණියෝ ද මෑණියන්ගේ සහෝදරී වූ ක්ලෝපාස්ගේ භාර්යාව වූ මරියා ද මග්දලාගේ මරියා ද උන් වහන්සේගේ කුරුසිය ළඟ සිටියෝ ය. එකල ජේසුස් වහන්සේ සිය මෑණියන් ද තමා ප්‍රේම කළ ශ්‍රාවකයා ද ළඟ සිටිනු දැක, "ස්ත්‍රිය, මෙන්න, ඔබේ පුත්‍රයා ය"යි සිය මෑණියන් හට වදාළ සේක.

ඉන්පසු උන් වහන්සේ එම ශ්‍රාවකයාට කතා කොට, "මෙන්න, ඔබේ මෑණියෝ ය" යි වදාල සේක. ඒ මොහොතේ සිට ඒ ශ්‍රාවකයා තම නිවසට ඇය පිළිගත්තේ ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*

හෝ

## සුවිශේෂය ලූක් 2: 33–35

*සුවිශේෂක ලූක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"ඔබේම හදවත කඩුවකින් අනිනු ලැබුවාක් මෙන් තුවාළ වනු ඇත."

ජේසුස් වහන්සේ පිළිබඳ ව කී දේ ගැන උන් වහන්සේගේ පියා ද මවු ද මවිත වූ හ. සිමියොන් ඔවුන්ට ආශිර්වාද කරමින් උන් වහන්සේගේ මව වූ මරිය තුමීට කතා කොට, "මේ දරුවා ඉශ්රායෙල්හි බොහෝ දෙනෙකුගේ වැටීම හා නැගීම පිණිසත්, ප්‍රතික්ෂේපයට ලක් වන දේව සළකුණක් වන පිණිසත් නියම ව සිටී. එසේ ය, ඔබේම හදවත කඩුවකින් අනිනු ලැබුවාක් මෙන් තුවාළ වනු ඇත. මෙසේ වන්නේ, බොහෝ දෙනෙකුගේ සිත්හි රහස් කල්පනා එළිදරව් වන පිණිස ය"යි කී ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*